# ජීවනශූරී 2005 සම්මානය අතුල කුඩාගමගේට



එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානය වාර්ෂිකව පිරිනමන ජීවනශූරී සම්මානය හා ගෞරව නාමය කොළඹ ජෙනරල් සේල්ස් සමාගමේ අලෙවි කළමනාකරු අතුල කුඩාගමගේ මහතාට ප්‍රදානය කරන ලදී.

අති විශිෂ්ට ව්‍යාපාරික හා අලෙවිකරන හැකියාවක්ද එම හැකියාවන් මානව වර්ගයාගේ සුබ සිද්ධිය වෙනුවෙන් යෙදවීම උදෙසා පිරිනැමුනු මෙම ජීවනශූරී සම්මානය දිළිඳුකම පිටුදැකීමේ ඇමැතිනී සවිත්‍රා වන්නිආරච්චි මහත්මියගේත් ශ්‍රී ලංකාවේ රුමේනියානු තානාපතිතුමාගෙත් අතින් පසුගියද කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැති විශේෂ උත්සවයකදී ප්‍රදානය කරන ලදී.

වසර 15 ක පමණ අලෙවිකරණ ක්ෂේත්‍රයේ අත්දැකීම් සමූහයක් ඇති කුඩාගමගේ මහතා ස්වකීය අලෙවිකරණ හා ව්‍යාපාරික හැකියාවන් ශ්‍රී ලංකාවේ ජීවන තත්ත්වය උසස් කර ගැනීමට යොදවා ගැනීමත් ස්වකීය වෘත්තීමය ජීවිතයේ ලබාගත් සාර්ථකත්වයත් මෙහිදී ඇගයීමකට ලක්ව තිබිණි.

අතුල කුඩාගමගේ මහතා ජාත්‍යන්තර අලෙවිකරණය පිළිබඳ විශේෂ ශ්‍රේණියේ ඩිප්ලෝමාධාරියකු වන අතර මොරටුව වේල්ස් කුමර විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි.